# සුරාබදු ආඥාපනත
## අංක 1002 දරන සුරාබදු නිවේදනය
## එතනෝල් නිෂ්පාදනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය මත සුරාබදු අනුපාත

සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරය වූ) 22 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මා විසින්, මෙම නියමය මගින්, මෙහි දැක්වෙන උපලේඛනයේ II තීරුවෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන බද්ද, I වන තීරුවේ ඊට අනුරූපී සටහන්හි නිශ්චිතව සඳහන් කරනු ලබන අමුද්‍රව්‍ය මත 10 නොවැම්බර් 2017 දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ 01,
09 නොවැම්බර් 2017.

### උපලේඛනය

| I වන තීරුව | | II වන තීරුව |
|---|---|---|
| සුරා බද්දට යටත් භාණ්ඩ | | ගෙවිය යුතු බද්ද<br>රු. ශත |
| (i) | පොල් රා (තොග ලීටරයක් සඳහා) | 05.00 |
| (ii) | මොලෑෂස් ( තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (iii) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන සහල් පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (iv) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන ඉරිඟු පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |
| (v) | ආසවනය මගින් ස්ප්‍රීතු නිෂ්පාදනය සඳහා යොදාගන්නා පළතුරු පල්ප (තොග කිලෝ ග්‍රෑමයක් සඳහා) | 10.00 |

### නියම හා කොන්දේසි

වෙනත් යම් නිවේදනයක විධිවිධානවල කුමක් සඳහන් වුවද, මෙම නියෝගය යටතේ පනවනු ලබන බද්ද –

(අ) යම් මාසයක පළමු දින පහළොව තුළ ආසවනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය තොගයට අදාළව එම මාසයේ අවසාන දිනට පෙර ගෙවිය යුතුය ; සහ

(ආ) එම මාසයේ පළමු දින පහළොවට පසු කාල සීමාව තුළ දී ආසවනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය තොගයට අදාලව ඊළඟ මාසයේ පහළොස්වන දිනයට පෙර ගෙවිය යුතුය.

එසේවුව ද, උපලේඛනයේ II වන තීරුව යටතේ පනවන ලද බද්ද මෙහි නියම කරන ලද කාල සීමාව තුළ දී ගෙවනු නොලබන්නේ නම්, එම බද්ද ගෙවීමට අමතරව මසකට සියයට තුනක් (3%) බැගින් වූ අනුප්‍රමාණයක අධිභාරයකට යටත්වනු ලැබිය යුතුය.